# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2018 අප්‍රේල් මස 03 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI/(1)/18/07)

---

අ. බස්නාහිර පළාත් සභාවෙන් පාලනය වන පාසල්වල රාත්‍රී මුරකරු තනතුරේ කොපමණ සංඛ්‍යාවක් සේවය කරන බව ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ආ. ඔවුන් බඳවා ගනු ලැබූ ක්‍රියා පටිපාටිය කුමක්ද? යන්න, ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ඇ. එසේ රාත්‍රී මුරකරු සේවයේ සේවය කරනු ලබන සමහර අය, රාත්‍රී කාලයේ එකී පාසල්වල සේවය නොකරන බව, ඔබතුමා පිළිගන්නෙහිද?

ඈ. රාත්‍රී මුරකරුවන්ගෙන් සමහරුන් සේවය නොකර පැමිණීමේ ලේඛණයට අත්සන් යොදා තම වැටුප ලබාගන්නා බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඉ. අදාල විදුහල්වල බලධාරීන්ගේ අනුග්‍රහය ද සහිතව, මෙලෙස පවතින නීති රීතීන්ට අනුකූලව, රාජකාරිය නොකිරීම, සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද? යන්නත්, ඔවුන් නියමිත පරිදි රාජකාරියේ යෙදවීමට ඔබතුමා ගනු ලබන පියවර කවරේද? යන්නත්, වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නේද?

ඊ. නොඑසේනම් ඒ මන්ද?

02. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ඉ/VI/(1)/18/08)

අ. බස්නාහිර පළාත් සභාවෙන් පාලනය වන පාසල්වල කම්කරු තනතුරේ කොපමණ සංඛ්‍යාවක් සේවය කරන බව, ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ආ. ඔවුන් බඳවා ගනු ලැබූ ක්‍රියා පටිපාටිය කුමක්ද? යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නේද?

ඇ. එසේ කම්කරු තනතුරේ සේවය කරනු ලබන සමහර අය, දිනපතා එකී පාසල්වල සේවය නොකරන බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඈ. කම්කරු තනතුරේ සේවය කරන සමහර අය දිනපතා සේවයට නොපැමිණ පැමිණීමේ ලේඛණයට අත්සන් යොදා තම වැටුප ලබාගන්නා බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඉ. අදාල විදුහල්වල බලධාරීන්ගේ අනුග්‍රහයද සහිතව, මෙලෙස පවතින නීති රීතීන්ට අනුකූලව රාජකාරිය නොකිරීම, සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද? යන්නත්, ඔවුන් නියමිත පරිදි රාජකාරියේ යෙදවීමට ඔබතුමා ගනු ලබන පියවර කවරේද? යන්නත්, වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නේද?

ඊ. නොඑසේනම් ඒ මන්ද?

03. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ඉ/VI/(1)/18/09)

අ. 2016 සහ 2017 වසර දෙක තුල බස්නාහිර පළාත් සභා පාසල් තුලින් දිස්ත්‍රික්ක වශයෙන් විභාග අසමත්ව, වාර්ෂිකව පාසල් හැර ගිය උසස් පෙළ/ සාමාන්‍ය පෙළ සහ අනෙකුත් පංතිවල සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

ආ. වැඩිම සිසුන් පිරිසක් පාසල් හැර යන්නේ කුමන හේතූන් නිසාදැයි අධ්‍යාපන බලධාරීන් හඳුනාගෙන ඇත්තේද? ඒ හේතු මොනවාද?

ඇ. ඉහත කී වසරවල් සඳහා බස්නාහිර පළාත් පාසල් වල, දිස්ත්‍රික්ක වශයෙන් ගත් කල පළමු වසරට ඇතුලත් වූ සිසුන් සංඛ්‍යාව හා සැසඳීමේදී උසස් පෙළ සමත්ව උසස් අධ්‍යාපනයට යොමුවන සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය කොපමණද?

ඈ. මෙලෙස පාසල් හැර යන, විභාග අසමත් වන සිසුන්, පළාතේ ආර්ථික සංවර්ධනයට දායක කර ගනිමින් ඔවුන්ගේ ජීවන අභියෝග සාර්ථක කරගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

04. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ඉ/VI/(1)/18/10)

අ. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන මට්ටමින් අනුමත කර නොගත්, මහ පරිමාණ ගොඩනැගිලි නාගරික සංවර්ධන අධිකාරියට අයත් යැයි කියමින් කිසිදු අනුමැතියකින් තොරව පළාත පුරා ඉදිවන බව ඔබතුමා දන්නේද?

ආ. ඇතැම් පළාත් පාලන ආයතන මෙම මහා පරිමාණ ගොඩනැගිලි තමන්ගේ විෂය පථයට අයත් නැතැයි යන මතයේ සිට ඒ පිළිබඳව කිසිදු සොයා බැලීමක් පවා නොකරන බව ඔබතුමා දන්නේද?

ඇ. එවැනි ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත ඔබතුමන් විසින් මාර්ගෝපදේශයන් ලබා දෙන්නේද?

ඈ. දැනටමත් මෙලෙස ඉදිකර ඇති මහා පරිමාණ ඉදිකිරීම් සම්බන්ධ තොරතුරු වාර්තාවන් පළාත් පාලන ආයතන මගින් කැඳවා ගැනීමට ඔබතුමා කටයුතු කරන්නේද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

05. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු කෘෂි කර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ඉ/VI/(1)/18/11)

අ. බස්නාහිර පළාතේ කුඹුරු වලින් ලැබෙන වී අස්වැන්න බස්නාහිර පළාතේ ජනතාවගේ පරිභෝජනයට දායක වන්නේ කුමන ප්‍රතිශතයකින්ද?

ආ. බස්නාහිර පළාතේ ජනතාවගේ පරිභෝජන අවශ්‍යතා සැපිරීම සඳහා ප්‍රමාණවත් වන වී අස්වැන්න ලබා ගැනීමට නම් වගා කල යුතු කුඹුරු හෙක්ටයාර ප්‍රමාණය කොපමණද?

ඇ. බස්නාහිර පළාත තුල මේ වනතෙක් වගා නොකරන පුරන් කුඹුරු හෙක්ටයාර ප්‍රමාණය කොපමණද?

ඈ. වසර ගණනක් තිස්සේ වල් පැළ වැවෙමින් තිබෙන පුරන් කුඹුරු ප්‍රදේශයේ ජනතාවගේ ආහාර අවශ්‍යතා වෙනුවෙන් යොදා ගැනීමට හැකි වන ලෙස සකස් කිරීම සඳහා ඔබතුමා ඉදිරිපත් කරන ක්‍රමවේදය කුමක්ද?

ඉ. බස්නාහිර පළාත මෙරටට ආදර්ශවත් පළාතක් ලෙස හඳුන්වා දෙමින් දැනට පළාත සතුව ඇති සම්පත් භාවිත කරමින් ආහාරයෙන් ස්වයංපෝෂිත පළාතක් බවට බස්නාහිර පළාත පරිවර්තනය කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම්

<u>ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :</u>

යෝජනාව :

"2018.03.21 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලද එකඟතාවයට අනුව, අද දින (2018.04.03) දින විසිර යාමෙන් අනතුරුව, මෙම සභාව, 2018.05.08 වන දින (අඟහරුවාදා දින ) පෙ.ව. 9.30 ට, රැස්විය යුතු අතර, <u>2018.04.17 දිනය</u> (අඟහරුවාදා දිනය), සභා රැස්වීම <u>නොපැවැත්වෙන</u> දිනයක් ලෙස සළකා ක්‍රියා කළ යුතුය."

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමියः

"ශ්‍රී ලංකාව වසර 2500 කට එහා ගිය වැදගත් ඉතිහාසයක් ඇති රටක් ලෙස, අප විසින් උදම් අනමින් සිටිය ද, අපගෙන් පසු එන පරපුරට සාරගර්භව අභිමානයකින් යුතුව, වර්ණනා කල හැකි අතීතයක් හිමි වන පරිදි, වර්තමානයේ දේශපාලන නායකයන් වන අප විසින් දියුණු රටක් නිර්මාණය කිරීමට කටයුතු කර නොතැබුවහොත්, එය අපගේ වගකීමක් පැහැර හැරියා වේ. එහෙයින් ජාතික ධනය, බලය, මෙන්ම, අප හැමගේම සුරු විරුකම්, හැකියාවන්, උපරිමයෙන් රටේ දියුණුව වෙනුවෙන් යොදවා, ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නගා, සැමදා ඇති වන ගංවතුර, නියඟ ආදී ස්වාභාවික විපත් වලින් මෙන්ම, අනාගතයේ ඇති විය හැකි ගැටළු ද, කලින්ම හඳුනාගෙන, ජාතික ප්‍රතිපත්තියක් ඔස්සේ, මෙරටේ ජාතික, ආගමික, සමාජමය, බලමුළු එක්තැන් කර සංහිඳියාවකින් යුතුව, එක මඟක් ගෙන, ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ද, ආරක්ෂා කර ගනිමින්, සීඝ්‍ර දියුණුවක් කරා, මෙම රට රැගෙන යාමට සියළුම මහජන නියෝජිතයින් පෙරමුණ ගත යුතු යැයි ද, ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි ද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, රජය වෙත යෝජනා කර සිටියි."

(යෝ/VI/(1)/17/11)

02. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමියඃ

"මෙරට පිළිගත් නීතිය අනුව ක්‍රියාත්මක යම් අධිකරණයක අධිකරණ බල සීමාව අධිකරණ සංවිධාන පනතේ දෙවන (2) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිසම සහ අභියාචනාධිකරණ සභාපතිවරයා විමසා අධිකරණ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ යුතු වේ. එවැනි නීති ප්‍රතිපාදනයන් සකසා ඇත්තේ පවතින අධිකරණ ක්‍රියාත්මක වන ආකාරයන් සහ ඒවායේ මතුවන ප්‍රායෝගික ගැටලු පිළිබඳව මනා අවබෝධයක් ඉහත කී පුද්ගලයන් හා ආයතන විසින් නිරන්තරයෙන් ලබාගන්නා හෙයිනි. එහෙත් මෑතකදී අධිකරණ බල සීමා නිර්ණයන් සිදු කිරීමේදී නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකර ක්‍රියා කර ඇති අවස්ථාවන්ද , දක්නට තිබේ. එහෙයින් අධිකරණ ක්ෂේත්‍රය කෙරේ පවතින මහජන විශ්වාසය වැඩිදියුණු වන ආකාරයෙන් එකී සියලු සීමා නිර්ණයන් නිසි ඇගයීමකට ලක් කර යම් වරදක් සිදුව ඇත්නම් එම වැරදි නීතිමය රාමුව තුල නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, රජය වෙත යෝජනා කර සිටියි."

(යෝ/VI/(1)/17/12)

## XI. සභාව කල් තැබීම

2018.03.27 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.